**මුදල් මණ්ඩලය**
**ශ්‍රී ලංකා මහ බැංකුව**

**2020 නොවැම්බර්** — **චක්‍රලේඛය** — **2020 අංක 10**

## කොවිඩ්-19 නිසා බලපෑමට ලක්වූ ව්‍යාපාර සහ පුද්ගලයින් සඳහා ණය සහන කාලයක් ලබාදීම

කොවිඩ්-19 වසංගතයේ දෙවන ව්‍යාප්තිය නිසා ව්‍යාපාර හා පුද්ගලයින් විසින් මුහුණපා ඇති ගැටළු සලකා බලමින් බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු (මින් මතුවට බලපත්‍රලාභී බැංකු ලෙස හැඳින්වෙන) විසින් කොවිඩ්-19 වසංගතය මගින් බලපෑමට ලක්වී ඇති පුද්ගලයන් හා ව්‍යාපාර වෙත ලබා දී ඇති ණය සහන යෝජනා ක්‍රමය (මින් මතුවට යෝජනාක්‍රමය ලෙස හැඳින්වෙන) 2020 ඔක්තෝබර් 01 දින සිට පහත පරිදි තවත් මාස හයක කාලයකින් දීර්ඝ කරන ලෙසට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලපත්‍රලාභී බැංකු වෙත නියෝග කර සිටී.

මේ අනුව, සියළු බලපත්‍රලාභී බැංකු විසින් ඉහත යෝජනාක්‍රමය ඒකාකාරී ලෙස ක්‍රියාත්මක කරවීම තහවුරු කිරීමේ අරමුණින් මෙම චක්‍රලේඛය නිකුත් කර ඇත. එසේ වුවද ගනුදෙනුකරු හට ලැබෙන සමස්ථ ප්‍රතිලාභය මෙම චක්‍රලේඛය මගින් පිරිනැමෙන සහනයන්ට වඩා අඩු නොවෙන සේ යම් කිසි බලපත්‍රලාභී බැංකුවක ට ගනුදෙනුකරුවන් වෙත අමතර ණය සහනයන් ලබාදිය හැක.

### 1. ණය සහන කාල සීමාව සහ එය බලපැවැත්වෙන අයුරු

(අ) සුදුසුකම් ලබන ගනුදෙනුකරුවන් හට ඔවුන් විසින් මුහුණපා ඇති මූල්‍ය දුෂ්කරතා සැලකිල්ලට ගනිමින් 2020 ඔක්තෝබර් 01 දින සිට ඇරඹෙන පරිදි මාස 6කට නොවැඩි කාලයක් හෝ අවශ්‍ය පරිදි ඊට අඩු කාල සීමාවක් සඳහා ණය සහන කාලසීමාවක්, බලපත්‍රලාභී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය හෝ වෙනත් බලය පවරන ලද අධිකාරියක් විසින් ලබාදී ඇති අභ්‍යන්තර මාර්ගෝපදේශ වලට අනුකූලව, ලබා දිය යුතුය.

(ආ) දුෂ්කරතා වලට මුහුණපා ඇති ගනුදෙනුකරු විසින් කර ඇති ඉල්ලීමට අනුව මුල් ණය මුදල සහ පොලී යන කොටස් දෙක සඳහාම ණය සහන කාලය පිරිනැමිය යුතුය.

## 2. අයදුම්පත් භාර ගැනීමේ අවසන් දිනය

සුදුසුකම් ලබන ණය ගනුදෙනුකරුවන් විසින් 2020 නොවැම්බර් 30 වන දින හෝ ඊට පෙර ලිඛිතව හෝ විද්‍යුත් මාධ්‍යයෙන් සිය ඉල්ලීම ඉදිරිපත් කල හැක. බලපත්‍රලාභී බැංකු විසින් දුෂ්කරතා වලට මුහුණපා ඇති ගනුදෙනුකරුවන් හට ණය සහන සඳහා ඉල්ලුම් කිරීමට සහ ලබා දෙනු ලබන සහන, අයදුම්කල යුතු අවසාන දිනය සහ අයදුම් කල යුතු ආකාරය ආදී තොරතුරු ඇතුලත් සරළ ආකෘති පත්‍රයක් විද්‍යුත් (විද්‍යුත් තැපැල් සහ කෙටි පණිවිඩ සේවා ඇතුලත්ව) සහ/හෝ මුද්‍රිත මාධ්‍යයන්ගෙන් ලබා දීමට කටයුතු කල යුතුය.

## 3. සුදුසුකම් ලබන ගනුදෙනුකරුවන්

(අ) සංචාරක, ඇඟළුම්, තොරතුරු තාක්ෂණ, තේ, කුළුබඩු, වැවිලි, සහසම්බන්ධිත සේවා පහසුකම් සපයන්නන්, උත්සව කළමණාකරන සහ අපනයන ක්ෂේත්‍රයේ සෘජු හා වක්‍ර ව්‍යාපාර ඇතුළු කොවිඩ්-19 නිසා වැඩකටයුතු අඩාල වූ සහ දේශීයව සහ විදේශයන්ගේ පැවති පොදුපහසුකම් හා සේවා වසාදැමීම නිසා අගතියට පත් ව්‍යාපාර, ව්‍යාපාර හිමියන් සහ පුද්ගලයන්.

(ආ) නිෂ්පාදන, මූල්‍ය නොවන සේවා, කෘෂිකාර්මික (සැකසුම් ඇතුළුව), ඉදිකිරීම්, අගය එකතුකිරීම්, අවසර ලත් දේශීය ඖෂධ සැපයුම්කරුවන් ඇතුළු වෙළඳ ව්‍යාපාර වල නිරතු සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර (රුපියල් බිලියන 1 දක්වා වර්ෂික පිරිවැටුම් දරන) සහ පුද්ගලයන්.

(ඇ) කොවිඩ්-19 ව්‍යසනය නිසා තම රැකියා හෝ ආදායම් අහිමිවූ ස්වයං රැකියා ව්‍යාපාර සහ පුද්ගලයන්.

(ඈ) කොවිඩ්-19 ව්‍යසනය නිසා තම ව්‍යාපාර/ආදායම වෙත බලපෑම් ඇතිවී ඇති, විදේශ මුදලින් ණය පියවීමට ඇති විදේශ විනිමය උපයන ව්‍යාපාර හා පුද්ගලයන්.

## 4. සුදුසුකම් ලබන ණය පහසුකම්

2020 ඔක්තෝබර් 01 දින වන විට සක්‍රිය කණ්ඩයේ පැවති, රුපියල් හා විදේශ මුදල් කාලීන ණය, කල්බදු (ලීසිං) පහසුකම්, උකස්, අයිරා, වෙළඳ මූල්‍යන ඇතුළු අනෙකුත් ණය පහසුකම්. බලපත්‍රලාභී බැංකු විසින් සෞභාග්‍යා කොවිඩ්-19 පුනරුද සහන

අදියර I, II සහ III යටතේ ලබා දුන් ණය පහසුකම් සඳහා ණය සහන කාලය ලබා දීමේ දී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2020 නොවැම්බර් 06 වන දින නිකුත් කරන ලද උපදෙස් පිළිපැදිය යුතුය.

**5. ණය සහන කාලයේ සැකැස්ම**

(අ) 2020 ඔක්තෝබර් 01 සිට 2021 මාර්තු 31 දක්වා හෝ අවශ්‍ය පරිදි ඊට අඩු කාලසීමාවක් සඳහා වන ණය සහන කාලසීමාව තුලදී ගනුදෙනුකරුවාගෙන් අයවීමට නියමිත මුල් ණය මුදල සහ ගිවිසගෙන ඇති පොලී අනුපාතිකයට අනුව පොලිය කාලීන ණයකට හැරවීමට බලපත්‍රලාභී බැංකු විසින් කටයුතු කල යුතුය.

(ආ) මෙම හරවන ලද කාලීන ණය සඳහා බැංකු විසින් ණය සහන කාලසීමාව අවසන් වූ වහාම පැවති 364-දින භාණ්ඩාගාර බිල්පත් වෙන්දේසි අනුපාතිකයට සියයට එකක් එකතු කල වාර්ෂික පොලී අනුපාතයක් (364-days Treasury Bills auction rate plus 1 per cent per annum) අයකල හැක. විදේශ මුදල් ණය සඳහා දැනට පවතින වෙළඳපොළ පොලී අනුපාතයට වඩා අඩු පොලී අනුපාතයක් හෝ ගිවිසුම්ගත පොලිය යන විකල්ප දෙකෙන් අඩු අගය හරවන ලද ණය පහසුකම සඳහා අයකල යුතුය.

(ආ) මෙලෙස හරවන ලද කාලීන ණය ආපසුගෙවීමේ අවම කාලය මාස 24ක් වන අතර එම ණය ආපසුගෙවීම 2021 අප්‍රේල් 01 දින සිට ඇරඹිය යුතුවේ.

(ඈ) අයිරා සඳහා 2020 ඔක්තෝබර් 01 සිට 2021 මාර්තු 31 දක්වා හෝ අවශ්‍ය පරිදි ඊට අඩු කාලසීමාවක් සඳහා වන ණය සහන කාල සීමාව තුලදී අයවීමට නියමිත පොලී කාලීන ණයකට හැරවීමට බලපත්‍රලාභී බැංකු කටයුතු කල යුතු අතර, එම කාලීන ණය සඳහා අයකල හැකි උපරිම වාර්ෂික පොලිය සියයට 4ක අගයකට නොවැඩි විය යුතුය. මෙලෙස හරවන ලද කාලීන ණය ආපසුගෙවීමේ අවම කාලය මාස 12ක් වන අතර එම ණය ආපසුගෙවීම 2021 අප්‍රේල් 01 දින සිට ඇරඹිය යුතුවේ.

(ඈ) කෙසේ වෙතත් ගනුදෙනුකරුවන් විසින් ඉහත කාලීන ණයකට හරවන ලද මුදල ඉක්මනින් ගෙවා දැමීමට අදහස්කරන්නේ නම් හෝ බලපත්‍රලාභී බැංකුව විසින් ඉහත නියම කරන ලද කාලයට වඩා වැඩි කාලයක් ලබා දීමට අපේක්ෂා

කරන්නේ නම් ඒ සඳහා හැකියාව පවතී. මෙලෙස කාලීන ණයකට හරවන ලද මුදල ආපසු ගෙවීම මෙම චක්‍රලේඛය මගින් දක්වා ඇති කාලසීමාවට වඩා වෙනස් කාලයකදී සිදු කරන්නේ නම් ඒ සඳහා සුදුසු පොලී අනුපාතිකයක් ගනුදෙනුකරු හා බැංකුව විසින් ගිවිසගත යුතුය.

(ඉ) උකස් පහසුකම් සම්බන්ධයෙන්, ණය සහන කාලය තුලදී අයවීමට නියමිතව ඇති දිනයන් 2021 අප්‍රේල් 01 දක්වා දීර්ඝ කල යුතුය.

(ඊ) ණය කාඩ් පත් සම්බන්ධයෙන් සුදුසුකම් ලබන ගනුදෙනුකරුවන් විසින් කරනු ලබන ඉල්ලීම් සලකා බැලීම සඳහා බලපත්‍රලාභී බැංකු විසින් සුදුසු පරිදි ව්‍යාපාරික තීරණ ගත යුතුය.

(උ) බලපත්‍රලාභී බැංකු විසින් ගනුදෙනුකරුවන්ගේ 2020 ඔක්තෝබර් 01 දින වන විට එකතුවී ඇති සහ නොපියවා ඇති දඩ පොලී ඇත්නම් ඒවා කපාහැරීමට කටයුතු කල යුතු අතර ණය සහන කාලසීමාව තුලදී දඩ පොලී එකතුකිරීම හෝ අයකිරීමට කටයුතු නොකල යුතුය.

(ඌ) බලපත්‍රලාභී බැංකු විසින් ඉහත ණය සහන ලබා දීම සඳහා අධික ගාස්තු හෝ අයකිරීමක් එකතු නොකල යුතුය.

(එ) බලපත්‍රලාභී බැංකු විසින් ණය සහන අනුමත කිරීමට ප්‍රථම ඒවායේ සැකැස්ම පිළිබඳව සුදුසුකම් ලත් ගනුදෙනුකරුවන් දැනුවත්කිරීමට කටයුතු කල යුතු අතර, යම් ණය සහන සඳහා කරනු ලබන ඉල්ලීමක් ප්‍රතික්ෂේප කිරීමේදී බලපත්‍රලාභී බැංකු විසින් එසේ ප්‍රතික්ෂේප කිරීම සඳහා හේතු පැහැදිලිව දැක්විය යුතුය.

6. **ණය සහන කාල සීමාව සම්බන්ධව ගිණුම්තැබීම**

බලපත්‍රලාභී බැංකු විසින් ණය සහන කාලසීමාවට අදාලව ගිණුම්තැබීමේදී ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත සහ කොවිඩ්-19 ව්‍යසනය සම්බන්ධව මූල්‍ය වාර්තාකරණයේ දී සැලකිය යුතු දෑ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් යම් අමතර මාර්ගෝපදේශ සපයන්නේ නම් ඒවා හා අනුගතව කටයුතු කල යුතුය. බලපත්‍රලාභී බැංකු හට මේ සම්බන්ධව අමතර මගපෙන්වීමක් අවශ්‍ය වන්නේ නම් ඒ සඳහා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයෙන් හෝ විගණකවරුන්ගෙන් විමසිය හැක.

**7. වාර්තාකරණ අවශ්‍යතා**

බලපත්‍රලාභී බැංකු විසින් 2020.12.15 දින සිට සෑම මසකම 15 සහ 30 වැනි දා වන විට තම බැංකුවෙන් ණය සහන ලබාගෙන ඇති ගනුදෙනුකරුවන් පිළිබඳ තොරතුරු අදාල දිනයේ සිට වැඩකරන දින 5ක් තුලදී බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත වාර්තා කල යුතුය.

**මහාචාර්ය ඩබ්. ඩී. ලක්ෂ්මන්**
*මුදල් මණ්ඩලයේ සභාපති සහ*
*ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති*